

# මේධා

## දික්වැල්ලේ මේධාලංකාර නාහිමි ගුණානුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහය

සුබෝධාරාම රජ මහා විහාරය
(කරගම්පිටිය පන්සල)
දෙහිවල



# මේධා

දෙහිවල සුබෝධාරාම පුරාණ මහා විහාරයෙහි
විහාරාධිපතිව වැඩවිසූ සිරි ගුණාලංකාරාවතංස පූජ්‍යපාද
දික්වැල්ලේ මේධාලංකාරාභිධාන නායක ස්වාමීන්
වහන්සේගේ විසිදෙවන ගුණානුස්මරණ පුණ්‍යෝත්සවය
නිමිත්තෙන් පළ කෙරෙන ශාස්ත්‍රීය සංග්‍රහය


සංස්කාරක
හතරබාගේ සුගතවංශ හිමි



ප්‍රකාශනය
සුබෝධාරාම පුරාණ මහා විහාරය
දෙහිවල

ප්‍රථම මුද්‍රණය: ශ්‍රී බුද්ධ වර්ෂ ක්‍රි.ව. 2012 ඔක්තෝම්බර් 15

# මේධා

## දික්වැල්ලේ මේධාලංකාර ගුණානුස්මරණ ශාස්ත්‍රීය සංග්‍රහය

---

සංස්කාරක : හතරබාගේ සුගතවංශ හිමි

---

ISBN-978-955-4615-00-7

---

පරිගණක වර්ණ යෝජනය : ශ්‍රියාන් සුරංග කුරේ

පිටකවරය : හතරබාගේ සුගතවංශ හිමි

---

ප්‍රකාශනය : සුබෝධාරාම පුරාණ මහා විහාරය
දෙහිවල

---

මුද්‍රණය : ක්‍රිස් ඇන්ඩ් ඩේව් ප්‍රින්ටින් ඇන්ඩ් පැකේජින්
නො. 47/28 බොරුපන මාවත,
රත්මලාන

---

මූල්‍යමය දායකත්වය : නිමල් ඩයස් ජයසිංහ

## සංස්කාරකගෙන් ........

අන්‍යයන්ට සත්කාර කොට තෙමේ ද සත්කාර ලබන්නේ වෙයි. අන්‍යයන්ට ගරු කොට තෙමේ ද ගරු කටයුතු තැනැත්තෙක් වෙයි. එම තැනැත්තා වර්ණ කීර්ති දෙක ලබන්නේ වෙයි.

අතිපූජ්‍ය දික්වැල්ලේ මේධාලංකාර හිමියන් අතිශය දුර්ලභ ගති ලක්ෂණ රැසකින් සමන්විත සංඝ නේතෘවරයාණ කෙනෙකි. භික්ෂුත්වය ශෝභමාන කරන උත්කෘෂ්ඨ ගුණාංග වන ඉවසීම, මෛත්‍රිය හා සුහද බව හෙවත් ප්‍රිය මානප බව යන ගුණාංගවලින් දික්වැල්ලේ නාහිමියන්ගේ චරිතය රැසයුණු බව නොරහසකි. එම ගුණාංග නිසාම උන්වහන්සේගේ 22 වන ගුණානුස්මරණය සිදුකරන අවස්ථාව දක්වා ද මෙම ප්‍රදේශයේ ගරුතර ස්වාමීන් වහන්සේලාගේ මෙන්ම දායකකාරකාදීන්ගේ ද නොමඳ පැසසුමට ලක්වනු නිරතුරුව අපි දැක ඇත්තෙමු. උන්වහන්සේ තුළ පැවති ප්‍රියමනාප බවට අලෝකයක් එක් කරමින් මිත්‍රශීලි බව කාරුණික බව අන්‍යයන්ට ගරුකිරීම ආදි ගුණවලින් බැබලුණු අව්‍යාජ අවිහිංසක තෙරනමක වූ දික්වැල්ලේ මේධාලංකාර නාහිමියන්ට උපහාර වශයෙන් උන්වහන්සේගේ 22 ගුණානුස්මරණ අවස්ථාවේ දී මෙවැනි ශාස්ත්‍රීය කර්තව්‍යයක් සිදුකිරීමට ලැබීම අප ලද භාග්‍යයක් කොට සලකමු.

කරගම්පිටිය සුබෝධාරාම මහාවිහාරයට ආලෝකයක් වූ මේධාලංකාර මහතෙරුන් වහන්සේ අනුස්මරණය කරන අවස්ථාවේ දි මෙම කටයුත්තට උපකාර වූවෝ බොහෝ වෙති. විහාරාධිපති කුට්ටිගල චන්දසුමන හිමියන් දැක් වූ උනන්දුව හා සහාය පුණ්‍යානුමෝදනා පූර්වකව සිහි කරමු. එසේම මෙම කටයුත්ත පිළිබඳව සිහිපත් කළ විගස ම මෙහි මුද්‍රණාධාර සැපයීමට මහත් කැපවීමෙන් කටයුතු කළ නිමල් ඩයස් ජයසිංහ මැතිතුමා ඇතුළු පවුලේ සැමට පුණ්‍යානුමෝදනා පූර්වකව ස්තුති කරන අතර සුබෝධාරාම විහාරස්ථානයේ නේවාසිකව වැඩවසන විද්‍යාමලන් පරිවේණාචාර්ය පණ්ඩිත දික්වැල්ලේ සාරානන්ද හිමියන් ඇතුළු සියලු සබ්‍රහ්මචාරීන් වහන්සේලා ද සිහිපත් කරන්නේ මෙත් සිත් පෙරටුවයි.

මෙම ශාස්ත්‍රීය සංග්‍රහය සාර්ථක කර ගැනීමට අපහට නිරතුරුව සදුපදේශයන් සැපයූ ආචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම

හිමියන්, මහාචාර්ය උදානි හෙට්ටිගේ, කථිකාචාර්ය විජිත කුමාර ආදි සියලු ආචාර්යවරුන්ට හා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයනාංශයේ ආචාර්ය මණ්ඩලයෙන් ලැබුන උපදේශයන් අතිශය කෘතඥ පූර්වක ව සිහිපත් කරමු. කල්‍යාණ මිත්‍රයන් වහන්සේලාට ද ශාස්ත්‍රීය ලිපි සම්පාදනයෙන් දායක වූ විද්වත් සැමටත් සෝදුපත් බැලීමෙන් කාරුණික වූ සැම වෙත ද අප කෘතඥතා පූර්වක පුණ්‍යානුමෝදනාව නො අඩුව හිමිවේ.

මෙම ශාස්ත්‍රීය සංග්‍රහය සාර්ථක කර ගැනීමට නන් අයුරින් උපකාරී කළ සැමටත්, නාහිමියන්ගේ ගුණානුස්මරණ පින්කම සිදු කිරීමට වෙහෙස වූ සුබෝධාරාම විහාරස්ථ සමිති ආදි සියලුම දායක කාරකාදීන් ද මෙත් සිත් පෙරටුව සිහිපත් කරමු. එසේම මුද්‍රණ කටයුතු මනරම් අයුරින් සිදුකරදුන් ක්‍රිස් ඇන්ඩ් ඩේව් හි අධිපති තුමන් ඇතුළු සැමටත් ස්තුතිය පෙරටු කොට පින් දෙමු. කරගම්පිටිය සුබෝධාරාම විහාරස්ථානයට හා දෙහිවල ප්‍රදේශයට ආලෝකයක් සැපයූ දික්වැල්ලේ නාහිමියන්ට මෙම ධර්මදාන පූජාවෙන් නිවන් සුව ලැබේවායි පතමු.

හතරබාගේ සුගතවංශ හිමි,<br>
සුබෝධාරාම පුරාණ මහා විහාරය.<br>
කරගම්පිටිය, දෙහිවල.<br>
2012-08-28

පටුන　　　　　　　　　　　　　　　　　　　　　　　　　　පිටුව

බෞද්ධ දර්ශනය


1. Modern Economic Crisis - A Buddhist Perspective — 01
Ven. Professor Naimbala Dhammadassi

2. බුදුදහමෙහි කර්මය හා විපාකය අතර පවත්නා සබඳතාව පිළිබඳ විමසීමක් — 19
මහාචාර්ය ඇකිරියගල නන්ද හිමි

3. උත්තම ජීවිතයක උත්තුංග අභිලාශය — 35
පණ්ඩිත උස්ගොඩ ධම්මගරු හිමි

4. ස්ථවිර සම්ප්‍රදායය හෙවත් ථෙරවාදයේ මූලික ලක්ෂණ — 43
ශාස්ත්‍රපති ජී.ඒ ගාමිණී රත්න ශ්‍රී

5. භාරතීය භෞතිකවාදය — 57
මහාචාර්ය නවගමුවේ රේවත හිමි

6. මනස පිළිබඳ බෞද්ධ ආකල්ප — 75
ශාස්ත්‍රපති කුඹුකේ චන්ද්‍රාලෝක හිමි

7. ප්‍රයෝගසිද්ධියේ කර්තෘත්ව ගැටලුව පිළිබඳ නව අර්ථකථනයක් — 87
ආචාර්ය මැදගම්පිටියේ විජිතධම්ම හිමි

8. ස්ත්‍රීත්වය අකුසල කර්ම විපාකයක් නොවේ — 93
දර්ශනපති කුඩාකත්නෝරුවේ විනීත හිමි

9. සූත්‍රපිටකාගත බුද්ධ ඥාණය පිළිබඳ විමසුමක් 103
ශාස්ත්‍රපති කඹ්ටකඩුවේ චන්දවිමල හිමි

10. පුද්ගල විවිධත්වය -දේවවාදී ආගමික ස්ථාවරය පිළිබඳ විමසුමක් 123
ශාස්ත්‍රපති මුල්ඇඬියාවල අග්ගවංස හිමි

11. යුද ගැටුම් පිළිබඳ බෞද්ධ විග්‍රහය 141
ගෞරව ශාස්ත්‍රවේදී වෙලගත්වල ධම්මානන්ද හිමි

බෞද්ධ ශිෂ්ටාචාරය

12. කරගම්පිටිය විහාර චිත්‍ර 157
මහාචාර්ය උදා හෙට්ටිගේ

13. Committing the word of the Buddha to writing: its significance and impact 169
*Professor Asanga Tilakaratne*

14. බෞද්ධ සදාචාර ධර්මවල මානසික පදනම 183
ශාස්ත්‍රපති එළමල්දෙණියේ සාරානන්ද හිමි

15. බෞද්ධ පුද පූජාවන්හි සමාජ විද්‍යාත්මක සහ මනෝවිද්‍යාත්මක වැදගත්කම 197
ආචාර්ය මොරගොල්ලාගම උපරතන හිමි

16. කරගම්පිටිය සුබෝධාරාමයේ විහාර බිතුසිතුවම් සහ ජාතකකතා 215
ආචාර්ය නිමල් වසන්ත මෙන්ඩිස්

17. පරියත්ති, පටිපත්ති, සහ පටිවේධ පිළිබඳ විග්‍රහයක්. 227

ශාස්ත්‍රපති කඩිහිංගල හේමසිරි හිමි

18. බෞද්ධ ජීව හිතවාදය හා විශ්ව සමාජය පිළිබඳ ආකල්පය 235

ශාස්ත්‍රපති දියගම නාරද හිමි

19. සත්වෝපමා වලින් නිරූපණය වන බුදුරජාණන් වහන්සේගේ පෞරුෂීය ලක්ෂණ කිහිපයක් 253

ශාස්ත්‍රපති විතාරන්දෙණියේ චන්දසිරි හිමි

20. බෞද්ධ කළමනාකරණය නූතන ජනසමාජයට : න්‍යායාත්මක් අධ්‍යයනයක 261

ශාස්ත්‍රපති එස්. විජිත කුමාර

21. ACritical Introduction to the Paintings of the Kandyan Kingdom 269

*Ven senior lecturer Miriswaththe Wimalagnana*

22. ථෙරවාදී භික්ෂුණී උපසම්පදාව යළි ස්ථාපිත කළ හැකි ද? 291

විනයාචාර්ය මකුලෑවේ සුදස්සන හිමි

භාෂා හා සාහිත්‍ය

23. විසිවන සියවසේ ශ්‍රී ලාංකේය සංස්කෘත භාෂා සාහිත්‍යයේ ප්‍රවර්ධනයට දමිළ උගතුන්ගේ දායකත්වය 303

රාජකීය පණ්ඩිත මීපිටියේ සීලරතන හිමි.

24. දීඝනිකාය ටීකා: කෙච්වාද විමර්ශනය 317

දර්ශනපති අරුණ කේ ගමගේ

25. ශ්‍රී ලාංකේය සමාජය සහ 'මල්' හා බැඳුණු සාහිත්‍යය 
ශාස්ත්‍රපති 341
නාවලපිටියේ අනුරාධා සුධම්මිකා භික්ෂුණිය

දර්ශනය හා මනෝවිද්‍යාව

26. බෞද්ධ හා ෆ්‍රොයිඩියානු මනෝ විශ්ලේෂණයට 
තුලනාත්මක ප්‍රවේශයක් 363
රාජකීය පණ්ඩිත කුඹුගොඩආරේ පඤ්ඤාලෝක හිමි

27. සමාජානුයෝජනය න්‍යාය හා ඵල 377
ශාස්ත්‍රපති කරදගොල්ලේ විජිතතිස්ස හිමි

# කරගම්පිටිය විහාර චිත්‍ර.

මහාචාර්ය උදා හෙට්ටිගේ

මෙම ස්ථානයේ ඓතිහාසිකත්වය සහ ශේෂිත භෞතික ...මය අනුව පැහැදිලිවම මහනුවර යුගය ඉක්මවා යන බව ...ත්. එමනිසා ස්ථානීය වැදගත්කම අතිමහත්ය. මේ අතරින් මා ...ත් අවධානය යොමු කරනුයේ මෙහි ඇති චිත්‍ර වෙතටයි. මේවා ඒවා ඉක්මනින් විනාශ වෙමින් පවතී. එහෙයින් මෙහි ඇති විශේෂත්වය සටහන් කරනු වස් මෙම ලිපිය ලිවීමට අදහස් කළෙමි. ''සුබෝධාරාමය'' යන ස්ථානීය නාමයට වඩා මා ඇලුම් කරන්නේ ''කරගම්පිටිය'' යන නාමයට බැවින් ''කරගම්පිටිය විහාර චිත්‍ර'' ලෙස මෙම ලිපිය මාතෘකා කොට දැක්වීමට මා අදහස් කරන ලදී.

කරගම්පිටිය රජමහා විහාරය ලෙස කා අතරත් ප්‍රසිද්ධ දෙහිවල නගරාසන්නව පිහිටි මෙම විහාරය ''සුබෝධාරාමය'' නමින් හඳුන්වනු ලබයි. කොළඹ - ගාල්ල ප්‍රධාන මාර්ගයේ දෙහිවල මංසන්ධියට ඉතාම ආසන්නව පිහිටිය ද මෙහි ඇති ඓතිහාසික වැදගත්කම අතිශය විශාල වන්නේ එහි ඇති පුරාවිද්‍යාත්මක හා ඓතිහාසික වටිනාකම නිසාමය. මෙය ඉතා සුන්දර ලෙස පිහිටි පොළොවෙන් මඳක් ඉහළට වන්නට ස්ථානගත වී ඇති අතර ගොඩනැගිලි සහ ස්ථානීයව දක්නට ලැබෙන සියලු ඉදිකිරීම් වල ද සුවිශේෂත්වය කියා නිම කළ නොහැකිය. ඒ එකකට එකක් විශේෂ වන ආකාරයට නිර්මාණය වී ඇති හෙයිනි. විහාරගෙය, ධර්ම ශාලාව, ආවාස ගොඩනැගිලි, පන්සතිගෙය ආදී සියල්ලෙහිම ඇත්තේ ඉතා සිත් ගන්නාසුලු ස්වභාවයකි. සිතුවම් අතින් ද දක්නට ලැබෙන්නේ කැපී පෙනෙන විශේෂත්වයකි.

විහාරයේ ඓතිහාසිකත්වය අනුව පරාක්‍රමබාහු රජ දවසේ සිට (ක්‍රි.ව.1412-1467) මහනුවර යුගය, බ්‍රිතාන්‍ය යුගය සහ ඊට පසු කාලීන අවධි දක්වාම වූ යුගයන් මෙම ස්ථානය සමඟ

සෘජු සම්බන්ධකම් පවත්වා ඇති බව පෙනේ. විශේෂයෙන් රාජාධිරාජසිංහ රජු කල (ක්‍රි.ව.1780-1800) හෝ ඊට ප්‍රථම මෙහි බුදු පිළිම ආදිය කරවන්නට ඇති බව ඒවායේ නිර්මාණ ලක්ෂණ අනුව පැහැදිලි වේ. (Chutiwongs, 1996). විශේෂයෙන්ම යටත් විජිත සමයේ මෙහි තිබූ සම්බන්ධතාවය විහාරගෙය අභිමුඛයෙහි දක්නට ලැබෙන වික්ටෝරියා මහ රැජිනගේ රුවෙන් සනාථ වේ. සත්‍ය ලෙසම මෙම සහසම්බන්ධතාවය එහි ඇති ශෛලීය ගුණාංග වලින් පවා අනාවරණය වේ. එසේම ලන්දේසි පිඟන් කැබලි මගින් විහාර පොළෝ මස්තකයෙහි වන මොසැක් මෝස්තර වලින් (ක්‍රි.ව.1898 ?) විහාරස්ථානයෙහි විවිධ ඓතිහාසික යුග වලදී දක්වූ සම්බන්ධතාවය තවදුරටත් තහවුරු කරයි. මේ සම්බන්ධව සේනක බණ්ඩාරණායක මහතා ද අදහස් පළ කර ඇත. (Bandaranayake 1986). මෙහි ඉතිහාසය පිරික්සා බැලීමේදී කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මෙන්ම රාජාධිරාජසිංහ රජුගේ අප්‍රමාණ දායකත්වය මෙම ස්ථානයට ලැබී තිබෙන බව චෛත්‍ය, සත්සතිගෙය, අනෙකුත් සාධක සහ ගොඩනැගිලිවල පුරාවිද්‍යාත්මක අගය පිරික්සීමෙන් සනාථ වේ. බෝධි වෘක්ෂය, සණ්ඨාරකුළුණ සහ විවිධ කාල පරාස නියෝජනය කරන කැටයම් සහ ලක්ෂණ වලින් ද මෙම ස්ථානය සමන්විතය.

## විහාරගෙයි චිත්‍ර.

ඉතාම අලංකාර ලෙස ක්‍රමවත්ව නිර්මිත වැලි මළු කීපයක උසම මාලකයේ දක්ෂිණාර්ථව විහාරගෙය ස්ථානගත වී තිබේ. මෙය ඉතාම සිත් ගන්නා සුලු, සරල නිමාවකින් යුක්ත වේ. ... කුළුණු කීපයකින් යුත් විවෘත මණ්ඩපයකින් ඇතුළු වූ ... විහාරගෙය අභිමුඛ බිත්තිය දක්නට ලැබේ. ඇතුළු මාලය සහ ... මාලයකින් සමන්විත මෙය දොරටු කිහිපයකින් සමන්විත ... අභිමුඛයෙහි වන මකර තොරණ ඉතා සිත් ගන්නා සුලුය. ... ගැබෙහි දක්නට ලැබෙන සැතපෙන පිළිම වහන්සේ සහ හිටි ... පිළිම වහන්සේ එහි ඇති ගාම්භීර සුන්දරත්වය ත්‍රිව්‍ර කරයි. ... බහුලව දක්නට ඇත්තේ ඇතුල් මාලයේ අභ්‍යන්තර හා පිට ... ආශ්‍රයෙහිත් සිවිලිමෙහිත් ය. පිටමාලයේ පිට බිත්ති වල ... තීරුවෙහිත් සිවිලිමෙහිත් සිතුවම් ආවලියක් දක්නට ලැබේ.